# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2318/51 - 2023 පෙබරවාරි මස 10 වැනි සිකුරාදා - 2023.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාතේ 1990 අංක 03 දරන නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයයි**

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මා වෙත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාතේ 1990 අංක 03 දරන නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම සම්බන්ධ ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ පිරිනැමී ඇති බලතල ප්‍රකාරව පහත රෙගුලාසි මෙයින් පනවනු ලබන බව නිවේදනය කරමි.

තවද ඉහත කී රෙගුලාසි 2023 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි බලපැවැත්විය යුතු බව ද මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී, පීඑච්ඩී(ගෞරව)
එෆ්.අයි.එම් (ශ්‍රී ලංකා) එන්ඩීසී, පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2023 පෙබරවාරි මස 06 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.


1A - PG 6209 — 46 (2023/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## රෙගුලාසි

01. මෙම රෙගුලාසි බස්නාහිර පළාතේ නිවාස සංවර්ධන අරමුදල යටතේ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ආධාර පිරිනැමීමට අදාලව විධිවිධාන සැලසීම සඳහා ද එම කරුණට අදාලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1552 දරන 2008 මැයි 30 දිනැති *ගැසට් පත්‍රය* යටතේ හා අංක 1916/9 දරන 2015 මැයි මස 27 දිනැති අති විශේෂ *ගැසට් පත්‍රය* යටතේ ඇතුළත් රෙගුලාසි පරිච්ජින්න කිරීම සඳහා පනවනු ලබයි.

02. මෙම රෙගුලාසි බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ආධාර ලබාදීම සම්බන්ධ රෙගුලාසි යනුවෙන් හැඳින්වේ.

03. බස්නාහිර පළාත් නිවාස සංවර්ධන අරමුදල මගින් අඩු ආදායම්ලාභි පවුල් සඳහා ලබාදෙනු ලබන නිවාස ආධාර පහත සඳහන් කාණ්ඩ යටතේ අනුරූපීව සඳහන් වටිනාකම යටතේ විය යුතුය.

| *කාණ්ඩය* | *වටිනාකම* |
|---|---|
| 01. 5'අ'(1). නිවසක් අලුතින් ඉදිකිරීම.<br>මේ සඳහා ආධාරලාභියෙකුට ගෙවන උපරිම ආධාර මුදල (වාරික ගණන 2කි.)<br>(i) වැඩ ආරම්භ කිරීමට සූදානම් කළ විට - රු. 100,000.00<br>(ii) කොටසක් අවසන් කළ නිවසේ ඉතිරි කොටස සම්පූර්ණ කිරීම සඳහා - රු. 100,000.00 | රු. 200,000.00 |
| 02. 5'අ'(2). තිබෙන නිවස වැඩිදියුණු කිරීම හා කොටසක් නිමකර ඇති නිවස සම්පූර්ණ කිරීම සඳහා (වාරික ගණන 2කි.)<br>(i) වැඩ ආරම්භ කිරීමට සූදානම් කළ විට - රු. 50,000.00<br>(ii) නියමිත වැඩ කොටස අඩක් නිම කළ විට - රු. 50,000.00 | රු. 100,000.00 |
| 03. 5'අ'(5). ''වහලය සකස් කිරීම සඳහා මූල්‍යාධාර ලබාදීම'' යන රෙගුලාසිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ. | |

04. රෙගුලාසි ක්‍රියාත්මකවන දින සිට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1,552 හා 2008 මැයි 30 දිනැති *ගැසට් පත්‍රය* යටතේ සඳහන් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1916/9 හා 2015 මැයි 27 දිනැති අති විශේෂ *ගැසට් පත්‍රය* යටතේ සඳහන් නිවේදනයන්ට ඇතුළත් බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ආධාර ලබා දීමට අදාල රෙගුලාසි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

05. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම රෙගුලාසි යටතේ ''අඩු ආදායම්ලාභියා'' යන්නට මාසිකව රු. 8000/=ක් නොඉක්මවන ආදායම් ඇති අයෙකු අදහස් වේ.

06. මෙම රෙගුලාසිවල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් සිංහල පාඨය ප්‍රමුඛ වේ.

EOG 02 - 0116

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.